# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/14 - 2018 මැයි මස 30 වැනි බදාදා - 2018.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බද්දේගම ජල සම්පාදන ක්‍රමය යටතේ ජල තටාකය ඉදිකිරීමට යෝජිත ඉඩමට යන ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 16 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1320.

*උපලේඛනය*

ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 184 A, නයාපාමුල ග්‍රාම නිලධාරි වසමේ, බද්දේගම නයාපාමුල ගමේ පිහිටි මහගොඩකන්ද නැමති බලයලත් මිනින්දෝරු ඥාණසිරි දහනායක මහතා විසින් 2013.09.10 දිනැතිව සකස් කරන ලද අංක 2013/051 දරන සැලැස්මේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0076 (පර්චස් 3.01) ක් පමණ වන පහත සඳහන් වන මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා ප්‍රධාන මාර්ගයේ සිට වෙහෙරමළුවට යන පාර ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා ප්‍රධාන මාර්ගයේ සිට වෙහෙරමළුවට යන පාර ; |
| *දකුණට* | : | ඩී. මාරකන්ද මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා ප්‍රධාන මාර්ගයේ සිට වෙහෙරමළුවට යන පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : දමයන්ති මාරකන්ද මිය
මහගොඩකන්ද
දැල්කඩ
බද්දේගම

06 - 613

1A - G 27755 — 51 (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දෙහිවල - ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක 07 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1373.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 537 B, කොහුවල ග්‍රාම නිලධාරී වසමේ, කොහුවල ගමේ ඇන්ඩර්සන් පාරේ පිහිටි ඇන්ඩර්ත් උද්‍යාන පෙදෙසේ වරිපනම් අංක 63/10 ඉඩමට යාබදව පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 06 ක් පමණ වන පහත සඳහන් වන මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

*උතුරට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* ඃ යෝජිත ගංවතුර පාලන වැඩ සටහන සඳහා වෙන්කර ඇති වගුරු මුඩුබිම් ;
*දකුණට* ඃ ඇන්ඩර්සන් උද්‍යාන පෙදෙස ;
*බටහිරට* ඃ වරිපනම් අංක 63/10 ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* ඃ සොයාගත නොහැක.

06 - 614/1

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දෙහිවල - ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක 08 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1374.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 537 B, කොහුවල ග්‍රාම නිලධාරී වසමේ, කොහුවල ගමේ කොළඹ - හොරණ පාරේ පිහිටි කීල්ස් සුපර් වෙළඳ සංකීර්ණය අසල වගුරු බිම් කොටසින් ප්‍රමාණයෙන් පර්චස් 3 ක් පමණ වන පහත සඳහන් වන මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

*උතුරට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* ඃ සොයාගත නොහැක.

06 - 614/2

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර - පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතියේ, යෝජිත ගිරාකඩුව ජලාශයේ සම්ප්‍රේෂණ නල එළීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 15 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1364.

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 631, ගිරාකඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගිරාකඩුව ගමේ පිහිටි (ඉඩමේ නම නොදනී) මේ සමග අමුණා ඇති දළ සැලැස්මේ පෙන්නුම් කෙරෙන ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 13 ක් පමණ වන පහත සඳහන් වන මායිම් තුළ වූ ඉඩම් කොටස තුන (03) ඃ

කැබලි අංක - 01

| | |
|---|---|
| *උතුරට* | ඃ එන්. එම්. කොයින්මැණිකේ මහත්මිය, එච්. එම්. දහනායක මහතා, එච්. එම්. සෙනෙවිරත්න මහතා, එච්. එම්. අනුලාවතී මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස, අත්පත්කර ගැනීමට යෝජිත කැබලි අංක 02 හා ටී. ජී. කමලාවතී මැණිකේ මහත්මිය හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | ඃ කේ. ජී. අත්තනායක මහතා හිමිකම් කියන ඉඩම හා කේ. සී. බී. කරුණාගම මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | ඃ ප්‍රාදේශීය සභා මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* ඃ

01. එන්. එම්. කොයින්මැණිකේ මහත්මිය,
නො, 33, ගිරාකඩුව - ජම්බුගහපිටිය.

02. එච්. එම්. සෙනෙවිරත්න මහතා,
නො, 33, ගිරාකඩුව - ජම්බුගහපිටිය.

03. එච්. එම්. අනුලාවතී මහත්මිය,
නො, 33, ගිරාකඩුව - ජම්බුගහපිටිය.

04. එච්. එම්. දහනායක මහතා,
නො, 33/2, ගිරාකඩුව - ජම්බුගහපිටිය.

කැබලි අංක - 02

| | |
|---|---|
| *උතුරට* | ඃ ටී. බී. හේරත් මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | ඃ පරවශතා අයිතිය ලබා ගැනීමට යෝජිත ඉඩම ; |
| *දකුණට* | ඃ ටී. ජී. කමලාවතී මැණිකේ මහත්මිය හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | ඃ අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක - 01. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* ඃ

එච්. එම්. එම්. ටී. බී. හේරත් මහතා,
නො. 34/2, මණ්දණ්ඩාවෙල,
ජම්බුගහපිටිය.

කැබලි අංක - 03

| | | |
|---|---|---|
| *උතුරට* | : | පරවශතාව අත්කර ගැනීමට යෝජිත කැබලි අංක - 01 ; |
| *නැගෙනහිරට* | : | දඹගහමුදුන මාර්ගය ; |
| *දකුණට* | : | ටී. ජී. කමලාවතී මැණිකේ මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | ටී. ජී. කමලාවතී මැණිකේ මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : : ටී. ජී. කමලාවතී මැණිකේ මහත්මිය,
නො. 10/14, ගිරාකඩුව,
ජම්බුගහපිටිය.

06 - 615

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.